

සියලු ම හිමිකම් ඇවිරිණි. | රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
# 40 - සංගීතය (පෙරදිග)

## ලකුණු දීමේ පටිපාටිය



රූප සටහන 01



රූප සටහන 02

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

විෂයය අංකය / பாட இலக்கம்: 40
විෂයය / பாடம்: සංගීතය (පෙරදිග)

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 4 | 21. | 3 | 31. | 2 |
| 02. | 3 | 12. | 2 | 22. | 4 | 32. | 2 |
| 03. | 1 | 13. | 4 | 23. | 1 | 33. | 3 |
| 04. | 3 | 14. | 3 | 24. | 2 | 34. | 3 |
| 05. | 1 | 15. | 1 | 25. | 2 | 35. | 1 |
| 06. | 2 | 16. | 2 | 26. | 4 | 36. | 1 |
| 07. | 3 | 17. | 1 | 27. | 4 | 37. | 2 |
| 08. | 1 | 18. | 2 | 28. | 3 | 38. | 2 |
| 09. | 1 | 19. | 3 | 29. | 4 | 39. | 4 |
| 10. | 2 | 20. | 1 | 30. | 1 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

| රාග විස්තර | භෛරවී රාගය | යමන් රාගය |
|---|---|---|
| ආරෝහණ | ස රි ගු ම ප ධු නි ස් | ස රි ග ම් ප ධ නි ස් |
| අවරෝහණ | ස් නි ධු ප ම ගු රි ස | ස් නි ධ ප ම් ග රි ස |
| වාදී | ම | ග |
| සංවාදී | ස | නි |

**3.** පහත වගුවේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

(i) A, B, C ස්වර ප්‍රස්තාර කොටස් අයත් වන රාග නම් කර, ඒ ඉදිරියෙන් එම ප්‍රස්තාර කොටස්වලට අදාළ තාල නම් කරන්න.

| | ස්වර ප්‍රස්තාර කොටස | රාගයේ නම | ප්‍රස්තාරයට අදාළ තාලයේ නම |
|---|---|---|---|
| A | ස රි / ගු - ම / ප ප / ප - ප /<br>ම ප / නි - නි / ධ ධ / ප - ප / | | |
| B | ග - රි / ස - ස රි / ග ප ධ / ප - - - /<br>ග ප ධ / ස් - ධ ප / ග - රි / ස - - - / | | |
| C | ග ප ම ග / ම රි ස - / ස ග ම රි / ග ම ප - /<br>ග - ම රි / ග ප ධ නි / ස් නි ධ ප / ම ග රි ස / | | |

(ii) A, B, C ස්වර ප්‍රස්තාර කොටස්වලට අදාළ තාලවලට අයත් ඡේකා මාත්‍රා සහ තාල සංඥා දක්වමින් ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත රාගවලට අයත් සර්ගම්වල ස්ථායි කොටස් ස්වර ප්‍රස්තාර කරන්න.

3. පහත වගුවේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

( i.) A,B,C, ස්වර ප්‍රස්තාර කොටස් අයත් වන රාග නාමයන් ලියා, ඒ ඉදිරියෙන් එම ප්‍රස්තාර කොටස් වලට අදාල තාලයේ නම ලිවීමට.

එක් පිළිතුරකට ලකුණු භාගය බැගින් පිළිතුරු කොටස් 6 ට - ලකුණු 03 යි.

| | ස්වර ප්‍රස්තාර කොටස | රාගයේ නම | ප්‍රස්තාරයට අදාල තාලයේ නම |
|---|---|---|---|
| A | ස රි / ගු - ම / ප ප / ප - ප /<br>ම ප / නි - නි / ධ ධ / ප - ප / | **කාෆි රාගය** | **ඛඩප් තාලය** |
| B | ග - රි / ස - ස රි / ග ප ධ / ප - - - /<br>ග ප ධ / ස් - ධ ප / ග - රි / ස - - - / | **භූපාලි රාගය** | **දීප්චන්දි තාලය** |
| C | ග ප ම ග / ම රි ස - / ධ නි ස රි / ග රි ස - /<br>ග - ම රි / ග ප ධ නි / ධ ප ම ග / ම රි ස - / | **බිලාවල් රාගය** | **ත්‍රිතාලය** |

( ii.) A,B,C, ස්වර ප්‍රස්තාර කොටස් වලට අදාල ඣප් තාලය, දීප්චන්දි තාලය, සහ ත්‍රිතාලයට අයත් යේකා තාලවලට අයත් යේකා මාත්‍රා සහ තාල සංඥා දක්වමින් ප්‍රස්තාර කිරීමට

ලකුණු 03 යි.

( තාලා සංඥා යොදා නැත්නම් ලකුණු ½ බැගින් අඩු වේ. )

( iii.) ඉහත රාග වලට අයත් සර්ගම් වල ස්ථායි කොටස් ස්වර ප්‍රස්තාර කිරීමට ලකුණු 06 යි.

**මුළු ලකුණු 12 යි.**

A. නි̲ ධ ම / ප ගු̲ රි / ස රි ගු̲ / ම ප - /
ප ධ ම / ප ස̇ නි̲ / ධ ප ම / ගු̲ රි ස /


ස ස රි රි / ගු̲ ගු̲ ම ම / ප - - ම / ප ධ නි̲ ස̇ /
නි̲ ධ ප ම / ගු̲ - රි - / රි ප ම ප / ම ගු̲ රි ස /

B. ස̇ ස̇ ධ ප / ග රි ස රි / ග - ප ග / ධ ප ග - /
ග ප ධ ස̇ / රි̇ ස̇ ධ ප / ග ප ධ ප / ග රි ස - /


C. ග ප ධ නි / ස̇ - ධ ප / ම ග ම රි / ස රි ස - /
ග - ම රි / ග ප ධ නි/ ස̇ නි ධ ප / ම ග රි ස /

ස̇ නි / ධ නි / ස̇ - / ස̇ රි̇ / ස̇ නි / ධ ප /
ම ග / ම රි / ග ම / ප ග / ම රි / ස - /
නි̣ ස / ග රි /ස නි̣ /ධ̣ ධ̣ / ස - / රි ස /
ග ම / ග රි / ග ම / ප ග / ම රි / ස - /

4. (i) පහත රූපසටහන්වලින් දැක්වෙන සංගීත භාණ්ඩ හඳුනාගෙන පිළිවෙළින් නම් කරන්න.



රූපසටහන 01



රූපසටහන 02


(ii) පහත (අ) සහ (ආ) කොටස් අතුරෙන් **එකකට** පමණක් පිළිතුරු සපයන්න.

(අ) රූපසටහන **01** හි අංක 1 සිට 8 දක්වා ලකුණු කර ඇති ස්වර නියමිත ස්වර සංඥා සමග අංක පිළිවෙළට ලියා **A** සිට **D** දක්වා කොටස් නම් කරන්න.


(ආ) රූපසටහන **02** හි අංක 1 සිට 8 දක්වා ලකුණු කර ඇති අවනද්ධාක්ෂර සහ **A** සිට **D** දක්වා කොටස් නම් කරන්න.

(iii) ඉහත (ii) කොටස සඳහා ඔබ තෝරාගත් සංගීත භාණ්ඩය වාදනයට සුවිශේෂී වන භාරතීය සංගීතඥයකු පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.

(i) පහත රූප සටහන් වලින් දක්වෙන සංගීත භාණ්ඩ නම් කිරීමට ලකුණු 02 යි.
රූප සටහන 01 සිතාරය. රූපසටහන 02 තබ්ලාව.



රූප සටහන 01



රූප සටහන 02

(ii) පහත (අ) සහ (ආ) කොටස් අතරින් එකකට පිළිතුරු සැපයීමට ලකුණු 06 යි.

(අ) රූප සටහන 01 හි අංක 1 සිට 8 දක්වා ලකුණු කර ඇති ස්වර නියමිත සංඥා සමග අංක පිළිවෙළට ලියා A සිට D දක්වා කොටස් නම්කිරීම.

(ආ) රූප සටහන 02 හි අංක 1 සිට 8 දක්වා ලකුණු කර ඇති අවනද්ධාක්ෂර සහ A සිට D දක්වා කොටස් නම්කිරීම.

(අ) ස්වර සහ කොටස් නාම.

1. ප
2. ධ
3. නි
4. ස
5. රි
6. ග
7. ම
8. ප

A. මේරු
B. කුංඩී
C. පර්දා
D. තුම්බා

(ආ) අවනද්ධාක්ෂර සහ කොටස් නාම.

1. ග (ගෙ)
2. කත්,
3. නා (තා)
4. තිං (ති)
5. ධා
6. ධිං,
7. ති,
8. ට.

A. ස්‍යාහි
B. ලවය.
C. චාන්ටි.
D. බද්ධි.

(iii) ඉහත ii කොටසට ඔබ තෝරා ගත් භාණ්ඩයට සුවිශේෂී වන භාරතීය සංගීතඥයෙක් පිළිබඳ කෙටි විස්තරයක් සැපයීමට ලකුණු 04 යි.
( මුලු ලකුණු ලැබීමට ජීවන තොරතුරු, නිර්මාණ හෝ කළ සේවාව පිළිබඳ කරුණු දක්වා තිබිය යුතුය. )

- රූප සටහන 01. කොටසට පණ්ඩිත් රවිශංකර් ,
- රූප සටහන 01.කොටසට උස්තාද් ශකීර් හුසේන්.

--------------------

**මුලු ලකුණු 12 යි.**

--------------------

- **රවිශංකර්**

- 1920 අප්‍රේල් මස 7 දින ඉන්දියාවේ බරණැස් නුවර දී උපත ලැබීම.
- සම්පූර්ණ නම රවීන්ද්‍ර ශංකර් චෞද්රි
- " පණ්ඩිත් " යන ගෞරව නාමය ලැබීමෙන් පසු පණ්ඩිත් රවි ශංකර් නමින් ප්‍රකට වීම.
- සත්‍යජිත් රායි ගේ චිත්‍රපටවල පසුබිම් සංගීතය නිර්මාණයෙහි නිරත වීම.
- 1949 සිට 1956 දක්වා ඕල් ඉන්දියා (all india ) ගුවන් විදුලි සේවාවෙහි සංගීත අධ්‍යක්ෂක ලෙස සේවය කිරීම.

- 1960 දී යෙහුදි මෙනුහින් නම් සුප්‍රකට වාදකයා සමග බීට්ල්ස් සංගීත කණ්ඩායමේ ගිටාර් වාදකයා වූ ජෝර්ජ් හැරිසන්ස් සමග බටහිර සංගීතය සමග තම සිතාරය මුසුකරමින් ප්‍රසංග ඉදිරිපත් කිරීම.
- ඉන්දීය සංගීතය පිළිබඳව ආරාධිත දේශකයකු ලෙස කැලිෆෝනියා සරසවියේ සේවය කිරීම.
- My music and my life – 1968, Learning Indian music – 1979 , නාදමාලා - 1997 යන කෘති රචනා කරමින් මතු පරපුරට දායාද කිරීම.
- 1999 දී ඉන්දියාවේ ඉහළම ගෞරව සම්මානය වන භාරතරත්න නාමයෙන් පිදුම් ලැබීම.
- 1970 - 1980 දශක වලදී මෙතුමා බටහිර සංගීතය සමග සිතාරය මුසු කරමින් වාදක මණ්ඩලය සඳහා සංගීත රචනා කරමින් එම කණ්ඩායම් සමග ලෝ වටා සංචාරයෙහි යෙදීම.
- එතුමාගේ අරමුණ වී ඇත්තේ ඉන්දියානු සංගීතය ලෝ පුරා ප්‍රචලිත කිරීමය.

➢ **උස්තාද් ශකීර් හුසේන්.**

- 1951 මාර්තු මස 09 දින ඉන්දියාවේ මහා මහාරාෂ්ට්‍ර ප්‍රදේශයෙහි මුම්බායි නගරයේ දී උපත ලැබීම.
- පණ්ඩිත් රවි ශංකර් ගේ සිතාර් වාදනය සමග තබ්ලා වාදනයේ යෙදුන උස්තාද් අල්ලා රක්ඛා මෙතුමාගේ පියා වීම.
- කුඩා කල සිටම දක්ෂ තබ්ලා වාදකයෙකු ලෙස ජනප්‍රිය වීම.
- මොහු තබ්ලා වාදකයෙකු මෙන්ම, සංගීත නිර්මාණකරුවෙකු (Track) හා නළුවෙකු ද වීම.
- " පද්ම ශ්‍රී " සම්මානයෙන් පිදුම් ලැබීම.
- 1991 දී සංගීත ඇකඩමිය මගින් පිරිනමන ලද " සංගීත් නාටක් " නම් සම්මානයෙන් පිදුම් ලැබීම.

**5.** (i) පහත සඳහන් ගැමි ගී පාද අදාළ වර්ගය අනුව වෙන් කරමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

- දුම්බර කන්ද සාමුල මීතිරත් පතලේ
- රන් දැකැති ගෙන නිති සැරසෙනවා
- එක සඳුරෙන් ලී සයක් කපා ගෙන
- අකට වෙරළු ඇහිඳ ගෙනේ
- බුද්ධං සරණේ සිරස දරා ගෙන
- ඉහළ වෙලේ තියෙන බැතා
- තන්ඩලේ දෙන්නා දෙපොලේ දක්කනවා

| | ගැමි ගී වර්ගය | නිර්මාණයට පදනම් වූ හේතු සාධක | ගීයේ විශේෂත්වය | නිදර්ශන ලෙස ගැමි ගී පාද |
|---|---|---|---|---|
| A | මෙහෙ ගී | | අනාසාකාත්මක | |
| | | | ආසාකාත්මක | |
| B | සමාජ ගී | | කෙළි ගී | |
| | | | දරු නැළවිලි ගී | |
| C | බැති ගී | | තුන් සරණේ ගී | |

(ii) ඔබ කැමති වන්නමක කවියක හෝ ප්‍රශස්තියක මුල් කොටස ලියා දක්වන්න.

(iii) වන්නම් හෝ ප්‍රශස්ති අතුරෙන් **එක්** වර්ගයක් තෝරාගෙන එම ගී වර්ගයේ සුවිශේෂ ලක්ෂණ ඇතුළත් කෙටි සටහනක් පිළියෙල කරන්න.

( i.) පහත සඳහන් ගැමි ගී පාද අදාල වර්ගයට වෙන්කරමින් පහත වගුව සම්පූර්ණ කිරීමට ලකුණු 05 යි.

| | ගැමි ගී වර්ගය | නිර්මාණයට පදනම් වූ හේතු සාධක | | නිදර්ශන ලෙස ගැමි ගී පාද |
|---|---|---|---|---|
| A. | මෙහෙ ගී | ගැමියාගේ ජීවනෝපාය ක්‍රම, ( වෘත්තීන්, ) | අනාඝාතාත්මක | • දුම්බර කන්ද පාමුල මිනිරන් පතලේ.<br>• තන්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා. |
| | | | ආඝාතාත්මක | • රන්දැකැති ගෙන නිති සැරසෙනවා.<br>• ඉහළ වෙළේ තියෙන බැතා. |
| B. | සමාජ ගී | විනෝදාස්වාදය හා සමාජීය අවශ්‍යතා | කෙළි ගී | • එක පඳුරෙන් ලී සයක් කපා ගෙන. |
| | | | දරුනැලවිලි ගී | • අතට වෙරලු ඇහිඳ ගෙනේ. |
| C. | බැති ගී | ඇදහිලි හා විශ්වාස | තුන්සරණේ ගී | • බුද්ධං සරණේ සිරස දරාගෙන |

( ii.) ඔබ කැමති වන්නමක කවියක් හෝ ප්‍රශස්තියක මුල් කොටස ලියා දැක්වීමට **ලකුණු 02 යි.**

( iii.) වන්නම් හෝ ප්‍රශස්ති අතරින් එක්කොටසක් තෝරා ගෙන එම ගී විශේෂයේ සුවිශේෂ ලක්ෂණ ඇතුළත් කෙටි සටහනක් පිළියෙළ කිරීමට **ලකුණු 05 යි.**

**මුලු ලකුණු 12 යි.**

**වන්නම් වල සුවිශේෂී ලක්‍ෂණ**

- සේ ගී විශේෂයක් වීම.
- කර්ණාටක සංගීතයේ ආභාසය ලැබීම.
- මහනුවර 'කවිකාර මඩුව' ආශ්‍රයෙන් නිර්මාණය වීම.
- 'තානම' යනුවෙන් සුවිශේෂ කොටසක් අන්තර් ගත වීම.
- සප්‍රාණික මෙන්ම අප්‍රාණික වස්තු ද වර්ණනා කිරීම.
- 'ගණිතාලංකාර' නම් දක්ෂිණ භාරතීය සංගීතඥයාගේ සහය ලැබීම.
- උඩරට, පහතරට හා සබරගමු වශයෙන් වර්ග වීම.
- උඩරට වන්නම් ගණනින් 18 ක් වීම.
- තානම, කවිය, කස්තිරම, සීරුමාරුව හා අඩව්ව යනුවෙන් කොටස් පහකින් යුක්ත වීම.
- ප්‍රධාන තාල වාද්‍ය ලෙස ගැටබෙරය යොදා ගැනීම.
- ගායන විශේෂයක් වුවත් පසු කාලීනව නර්තනයට එකතු වීම.

ප්‍රශස්ති

- සේ ගී විශේෂයක් වීම.
- කර්ණාටක සංගීතයේ ආභාසය ලැබීම.
- මහනුවර 'කවිකාර මඩුව' ආශ්‍රයෙන් නිර්මාණය වීම.
- කෝට්ටේ යුගයේ දී ආරම්භ වූවත් වර්ධනය හා ව්‍යාප්තිය මහනුවර යුගයේ දී සිදුවීම.
- මුද්‍රප්පදය යනුවෙන් සුවිශේෂ කොටසක් අන්තර්ගත වීම.
- පුද්ගල වර්ණනා පමණක් ඇතුලත් වීම.
- ගණිතාලංකාර නම් දක්ෂිණ භාරතීය සංගීතඥයාගේ සහය ලැබීම.
- ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩ ලෙස රබන්, පන්තේරු, උඩැක්කි භාවිත වීම.
- ගායන ශෛලියක් වුවත්, පසුකාලීනව නර්තනය ද එකතුවීම.
- සප්තක තුනම ඇසුරු කිරීම.

**6.** පහත දැක්වෙනුයේ සරල ගීතයකට අයත්, අපරදිග ස්වර ප්‍රස්තාර කොටසකි.



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරලා ප්‍රස්තාර කරන්න.

(ii) ඔබ විසින් ප්‍රස්තාර කළ පෙරදිග ප්‍රස්තාර කොටස පහත සඳහන් කොටස් එක් කරමින් ව්‍යවහාරික සංගීත ප්‍රස්තාර කොටසක් ලෙස සංවර්ධනය කරන්න.

- පළමු විභාග හතරට Repetition Mark යොදන්න.
- සෑම විභාගයක් මත ම ස්කේලයට අදාළ ව කෝඩ්ස් (Chords) යොදන්න.
- ප්‍රස්තාර කොටසේ අගට සහ මුලට Sign to Sign යොදන්න.

(iii) ඉහත පෙරදිග ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයට (F-Major Scale) පෙරලා ප්‍රස්තාර කරන්න.

6. පහත සඳහන් අපරදිග ප්‍රස්තාර කොටස සරල ගීතයකින් තෝරාගත් කොටසකි.



(i) ඉහත අපරදිග ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරලා ප්‍රස්තාර කිරීමට **ලකුණු 04**

ග ප ප / ග ප - / ම ධ ධ / ම ධ - / නි නි ප / නි නි ර් / ස - - / නිස ධනි ප /

(ii) ඔබ විසින් ප්‍රස්තාර කළ පෙරදිග ප්‍රස්තාර කොටස පහත සඳහන් කොටස් එක් කරමින් ව්‍යවහාරික සංගීත ප්‍රස්තාර කොටසක් ලෙස සංවර්ධනය කිරීමට ලකුණු 06 යි.

B. පළමු විභාග හතරට Repetition Mark යෙදීමට ලකුණු 01.

C. සෑම විභාගයක් මත ම ස්කේලයට අදාල ව කෝඩ්ස් (Chords ) ලකුණු 04.

D. ප්‍රස්තාර කොටසේ අගට සහ මුලට Sign to Sign යොදන්න. ලකුණු 01.

C C F F G G C C/G

[ ග ප ප | ග ප - | ම ධ ධ | ම ධ - ] නි නි ප | නි නි රි | ස් - - | නිස් ධනි ප |

(iii) ඉහත ප්‍රස්තාරය මධ්‍යම භාවයට ( F- Major Scale ) පෙරලා ප්‍රස්තාර කිරීමට **ලකුණු 02 යි**

**මුළු ලකුණු 12 යි.**

මධ්‍යම භාවයට ( F- Major Scale )

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධ | ස්̇ | ස්̇ | ධ | ස්̇ | - | නි̲ | ර්̇ | ර්̇ | නි̲ | ර්̇ | - |
| ග්̇ | ග්̇ | ස්̇ | ග්̇ | ග්̇ | ප්̇ | ම්̇ | - | - | ග්̇ම්̇ | ර්̇ග්̇ | ස්̇ |

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** තෝරාගෙන උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (i) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත හා සංගීත ක්ෂේත්‍රය තුළ දී එම නිර්මාණකරුවන් දැක්වූ දායකත්වය
   (ii) ශ්‍රී ලංකා ගුවන් විදුලිය ආශ්‍රිත ව ගොඩනැගුණු කණ්ඩායම් ගීතවල සාධනීය ලක්ෂණ
   (iii) සර්පිනාවක් භාවිතයේ දී එය දිගු කාලයක් රැක ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු කරුණු **හෝ** සර්පිනාවක වාදන නිපුණතාවය වර්ධනය කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග
   (iv) උතුරු ඉන්දීය චිත්‍රපට සංගීතයේ රාගධාරී පසුබිම
   (v) වයලීනය පිළිබඳ තොරතුරු ඇතුළත් දාශව උපකරණයකට අඩංගු කළ යුතු කරුණු

7. පහත සඳහන් මාතෘකා අතරින් තුනක් තෝරා ගෙන උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

   (i) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත හා නිර්මාණ කරුවන්ගේ දායකත්වය.

   (ii) ශ්‍රී ලංකා ගුවන් විදුලිය ආශ්‍රිතව ගොඩ නැගුණු කණ්ඩායම් ගීතවල සාධනීය ලක්ෂණ.

   (iii) සර්පිනාවක ව්‍යුහය හා එහි ගුණාත්මක බව රැක ගැනීමට අවධානය යොමු කළ යුතු කරුණු.

   (iv) උතුරු ඉන්දීය චිත්‍රපට සංගීතයේ රාගධාරී පසුබිම.

   (v) වයලීනය පිළිබඳ තොරතුරු ඇතුළත් දෘශ්‍ය උපකරණයක් සකසන අයුරු.

   එක් කොටසකට ලකුණු 04 බැගින් කොටස් 3 ට මුලු **ලකුණු 12 යි.**

පහත දැක්වෙන තොරතුරු සියල්ල පිළිතුරකට අඩංගු විය යුතු නැත. පරීක්ෂක වරයාගේ ප්‍රයෝජනය සඳහා ය.

(i) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත හා සංගීත ක්ෂේත්‍රය තුළ දී එම නිර්මාණකරුවන් දැක්වූ දායකත්වය

- ආනන්ද සමරකෝන්, සුනිල් සාන්ත,සූරිය ශංකර් මොල්ලිගොඩ, ආර්.ඒ.චන්ද්‍රසේන, එඩ්වින් සමරදිවාකර, අමරදේව, දේවාර් සූරියසේන, සරණ ගුප්ත අමරසිංහ, වැනි සංගීතඥයින්ගේ සංගීතමය දායකත්වය
- එන්නද මැණිකේ මමත් දියඹටා, පොඩි මල් එතනෝ, විලේ මලක් පිපිලා , පුංචි සුදා කිරිකැටියා, බැස සීතල ගඟුලේ, පුදමු මේ කුසුම්, සුමනෝ පොඩි සුමනෝ, කරුණා නදියේ පැද නාමූ, ඇසේ මධුර ජීවනයේ ගීතා, සිරි සරු සාර කෙතේ, සුනිල ගුවනේ පායා දිලෙන්නේ, මන රංජන දර්ශනීය ලංකා වැනි ගීත ( ආනන්ද සමරකෝන්)
- ඕලු පිපීලා, ලංකා ලංකා, මිහිකත නලවාලා, හෝ ගා රැල්ල බිඳේ, දියගොඩ සැම තැන, වරෙන් හීන් සැරේ, බෝවිටියා දං, එම්බා ගංගා, ඉදිරියටම යව්, අම්බලමේ පිනා, සුවඳ රෝස මල්, වැනි ගීත (සුනිල් සාන්ත)
- අක්කේ අක්කේ අර බලන්නකෝ, උදේම පිබිදෙන මලේ, (සූරිය ශංකර් මොල්ලිගොඩ)

වයලීනය

1. වයලිනයේ තත් සුසර කිරීම (Tuning) සඳහා යොදා ගනු ලබන ලී ඇණ = Peg (පෙග්)

2. ස්වර නිපදවා ගැනීම් සඳහා ඇඟිලි තබන පුවරුව. finger board (ෆින්ගර් බෝඩ්)

3. වයලිනය වාදනය සඳහා රඳවා ගැනීමේදී නිකට තබන කොටස. Chinrest (චින් රෙස්ට්)

4. තත් සුසර කරන ලී ඇණ සවිවී ඇති පෙට්ටියක් හැඩය ගත් කුහරයක් සහිත කොටස. peg box (පෙග් බොක්ස්)

5. වයලිනයේ හිසත් (Head) කඳත් (body) අතර ඇති බෙල්ලකට සමානව දිගටි කොටස. Neck (නෙක්)

6. වයලිනයේ මුදුනෙහි ඇති දඟරයක් හැඩය ගත් කොටස scroll (ස්ක්‍රෝල්)

7. නාද නිපදවීම සඳහා භාවිත ලෝහ කම්බි string (තත්)

8. සුසර කරන ඇණවලට සවි වී ඇති තතෙහි (String) මුල කෙළවර සවි වී ඇති කළු වර්ණය ගත් කොටස. Tailpiece (ටේල්පීස්)

9. සුසර කරන ඇණ සවි වී ඇති පෙට්ටියක් වැනි කොටසත් ඇඟිලි තබන කොටසේ ආරම්භයත් අතර ඇති ගැට්ටක් වැනි කුඩා ලී කොටස. Nut (නට්)

10. ස්වර නිෂ්පාදනයේදී ඇඟිලි තබන පුවරුව හා තත් හි මුල රඳවා ඇති කොටස අතර ඇති වර්ණ නොගැන්වූ, තත් රැඳ වීම සඳහා පාලමක්සේ උපකාරී වන කොටස. Bridge (බ්‍රිජ්)

11. වයලිනයේ කුහරය තුළ හටගන්නා නාදය පිටතට ගලා ඒම සඳහා ඇති F අකුරට සමාන සිදුර. F Hole (එෆ්හෝල්)

12. තත් හි මුල රඳවා ඇති කුඩා කොටස සවිව ඇති බොත්තමක් හැඩය ගත් කොටස. End Pin (එන්ඩ් පින්)

13. වයලීන් තත්හි මුල රැඳවීමට හා ඉතා සියුම් ලෙස සුසර කිරීමට භාවිත ලෝහමය උපකරණ Fine Tuners / Adjuster (ෆයින් ටියුනර් / ඇජස්ටර්ස්)

බෝව

1. තත් මත පිරි මදින කෙඳි (මෙය නයිලෝන් හෝ අශ්වයින්ගේ වලිගයේ ඇති කෙඳි භාවිතයෙන් නිෂ්පාදනය කර ඇත.) = Bow Hair (බෝ හෙයාර්)

2. බෝවේ මුල පිහිටි කෙඳි සවිව ඇති කුඩා පෙට්ටියක හැඩය ගත් කොටස. Frog (ෆොරොග්)

3. කෙඳි තද කරන බුරුල් කරන ඇණය. End Screw (එන්ඩ් ස්කුරු)


4. කෙඳි සවිවී ඇති බෝවේ අග තුඩක හැඩය ගත් කොටස. Tip / Bow Point (ටිප් / බෝ පොයින්ට්)


5. බෝව නිපදවා ඇති ලීය. = Stick (ස්ටික්)


6. වාදනයේ දී බෝව අල්ලනු ලබන මුල කොටසේ වටේට කම්බියක් ඔතා ඇති කුඩා කොටස. Bow Grip (බෝ ග්‍රිප්)

**සුසර කරන ක්‍රම**

| සංගීත සම්ප්‍රදාය | $G^{4th}$ | $D^{3rd}$ | $A^{2nd}$ | $E^{1st}$ |
|---|---|---|---|---|
| හින්දුස්ථානී ශාස්ත්‍රීය සංගීතය 1 | ප̣ | ස | ප | ස̇ |
| හින්දුස්ථානී ශාස්ත්‍රීය සංගීත 2 | ම̣ | ස | ප | ස̇ |
| හින්දුස්ථානී සරල සංගීතය | ම̣ | ස | ප | රි̇ |
| කර්ණාට සංගීතය | ස̣ | ප̣ | ස | ප |
| බටහිර සංගීතය | ප̣ | රි | ධ | ග̇ |




මීට අමතරව වයලීන වාදනය පිළිබඳ ප්‍රචලිත භාරතීය අපරදිග හා ශ්‍රී ලංකික සංගීතඥයන්ගේ නම් වට්ටෝරුවක් දෘෂ්‍ය උපකරණයේ අන්තර්ගත කොට තිබිය හැකිය.